- **සතර අභිනය**

අභිනය යනු සංස්කෘත භාෂාවේ එන වචනයකි. භරතමුනිගේ 'නාට්‍ය ශාස්ත්‍රයේ' අභිනය යන්න නිර්වචනය වන්නේ 'ඉදිරියට ගෙන ඒම' යන අර්ථයෙනි. අභිනය සිවු වැදෑරුම් ය.

1. ආංගික අභිනය
2. වාචික අභිනය
3. සාත්ත්වික අභිනය
4. ආහාර්යා අභිනය

එමෙන් ම නන්දිකේෂ්වර විසින් ඔහුගේ 'අභිනය දර්පණය' නම් ග්‍රන්ථයෙහි ආරම්භයේ දී ම ශිව දෙවියන්ට නමස්කාරයක් දක්වා ඇත.

" ආංගිකම් භුවනම් යස්‍ය
වාචිකම් සර්ව වාග්මයම්
ආහාර්යම් චන්ද්‍ර තරාදි
තංනුමඃ සාත්ත්විකම් ශිවම් "

- **ආංගික අභිනය**

නර්තනයක්, නාට්‍යයක කථාවක් හෝ සිද්ධියක් හෝ නළුවාගේ මාර්ගයෙන් ඉදිරියට ගෙන එන විට ප්‍රධාන මෙවලම වන්නේ ආංගික අභිනය යි. අංග, ප්‍රත්‍යංග හා උපාංග වශයෙන් ආංගික අභිනය කොටස් කරනු ලැබේ. අඟපසඟ හා හස්ත මුද්‍රා මෙන් ම නළුවන්ගේ සංචලන ද ආංගික අභිනයට අයත් වේ. වචනයෙන් භාවිත කිරීමට නොහැකි බොහෝ දේ ආංගික අභිනය මඟින් ප්‍රකාශ කළ හැකි ය.

අංග : හිස, කඳ, දෑත්, දෙපා.

ප්‍රත්‍යංග : බෙල්ල, උරබාහු, වැළමිටි, මැණික්කටුව

උපාංග : ඇඟිලි, ඇස, ඇහිබැම, තොල්

- **වාචික අභිනය**

නිරූපණය කරන රංගනයේ හැඟීම් අවධාරණය කිරීමට යොදා ගන්නා තවත් මෙවලමකි, වාචික අභිනය. නොයෙක් හැඟීම් දනවීමට සමත් අර්ථයක් ගෙන දෙන්නා වූ පද්‍ය, ගීත, සංවාද ආදිය මෙයට අයත් ය.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

- **ආහාර්යා අභිනය**

පිටතින් ගන්නා සියලු ම රංග වස්ත්‍රාභරණ භාවිතය වෙස් ගැන්වීම, වේදිකා උපකරණ, සැරසිලි උපයෝග කර ගනිමින් භාවයන්ගේ අර්ථය වඩාත් ඔපවත් කරනු ලබන්නේ ආහාර්යා අභිනය මාර්ගයෙනි. නර්තනයක හෝ නාට්‍යයක හෝ එක් එක් චරිත වෙස් ගැන්වීම ද ආහාර්යා අභිනයට ඇතුළත් ය.

ඒ අනුව ආහාර්යා අභිනයේ ප්‍රධාන අංග දෙකකි.

1. අංග රචනය
2. වෙස් මෝස්තරය රචනය

- **සාත්ත්වික අභිනය**

මෙහි දී නළුවා රංගනය කරන අවස්ථාවේ දී එහි ඇතුළත් වන හාස්‍ය, ප්‍රහර්ෂ, දුක්ඛ, දෝමනස්ස, විරහ, ශංකා, ලජ්ජා, භය, වීර ආදි කොට ඇති මිනිස් ස්වභාව නිරූපණය කිරීම සාත්ත්වික අභිනය ලෙස ගැනේ.

සාත්ත්වික අභිනයට අයත් වන්නේ මුහුණෙන් පෙන්වන හැඟීම් පමණක් ම නො වේ.

වෙවුලීම, කඳුළු සැලීම, ලොමුදැහගැනීම, දහදිය දැමීම, ශරීරය දරදඬු වීම වැනි ලක්ෂණ ද සාත්ත්වික අභිනයට ම අයත් බව භරතමුනි, නන්දිකේශ්වර වැනි රසවාදීන් ද පෙන්වා දී ඇත.

ඉහත කරුණු අනුව සතර අභිනය පිළිබඳ විස්තර ඉදිරිපත් කළ හැකි ය.

- **ප්‍රකාශන විධික්‍රම ලෙස සතර අභිනය භාවිත වන අවස්ථා**

ආංගික, වාචික, සාත්වික සහ ආහාර්යා යන චතුර්විධ අභිනයන් ප්‍රේක්ෂකයන් හට කිසියම් අදහසක් ලබා දීම සඳහාත්, රංගන අවස්ථා තීව්‍රකර පෙන්වීම සඳහාත් භාවිත කර ඇත. ශාන්තිකර්ම සහ ගැමි නාටකවල ප්‍රකාශන ක්‍රමවිධි බහුල ව දැකිය හැකි ය. උඩරට ශාන්තිකර්මවල මෙන් ම පහතරට හා සබරගමු ශාන්තිකර්මවල ද මෙකී අභිනය භාවිතය දක්නට ලැබේ.

ශාන්තිකර්මවල දක්නට ඇති ප්‍රකාශන විධි ක්‍රමවල දී වාචික අභිනයට අයත් සංවාද භාවිතය වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර, ඒවා හාස්‍ය රසයෙන් අනූන ය. කංකාරි රංග භූමියේ එක් පැත්තක සිට අනෙක් පැත්තටත් නැවත සිටින දිශාවටත් ගමන් කරමින් වාදකයා සහ ඇදුරා සංවාදයේ යෙදෙති. ඊට අමතර ව කවි ගායනා මඟින් චරිත ලක්ෂණ විස්තර කරනු ලැබේ.

උදා : උගුරා යක්කමෙහි එන සංවාද කොටසක්

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

ප්‍රධාන ඇදුරා : අනේ බොලං මං යන්ට එළිපත්තෙන් අඩිය තියන කොට ම උගුරෙන් වරිස් ගාලා පැගුණා.

බෙර වාදකයා : ඒ උගුරෙන් නෙවේ බොල ගෙම්බෙක්

'' හිසට හිස ලන්න ලා ගත්තු තොප්පියක්
කරට කරලන්න මුතු බැඳපු මාලයක්
ඉණට ඉණලන්න සුදු කරපු හවඩියක්
කපාලා දෙමිය ගම්මැහෙ බරට ගාතයක් ''

### පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායයන්ට අයත් අඹ විදමන

බෙරකරු : මේ මොකද මේ කුදු ගැහී ගැහී වෙවුලා වෙවුලා මේ කොහේ යනව ද? කතා කරල බලමු.

ඇදුරා (මහල්ලා) : (ඔළුව උස්සා අහක බලා ගනී.)

ගුරු : නැතෙයි කිසි සද්දයක්, වෙන විදියකට කතා කරලා බලමු. සීයේ, සීයේ,

ඇදුරා : සීයේ... දෙසීයේ ......තුන්සීයේ......

'' එක් සැරයටියක් පුරතින් දරා
රැක්වල ලෙස ගත පිළිකුත් දරා
එක්සිය විසි වයසත් මෙන් පුරා
සක්දෙව් සබයට ආ වෙස් දරා''

මේ අනුව දේශීය නර්තන සම්ප්‍රදායවල දී මෙන් ම විදේශීය නර්තන සම්ප්‍රදායවල දී ද සතර අභිනය භාවිත කෙරේ. භරත, කථක්, කථකලි, මනිපුරි යන සම්ප්‍රදායවල ද ප්‍රකාශන මාධ්‍යයක් ලෙස චතුර්විධ අභිනය භාවිත කෙරේ. දක්ෂිණ භාරතයේ භරත නාට්‍යම් හා කථකලි නර්තනය තුළ වැඩි වශයෙන් සතර අභිනය භාවිත වේ.

කථකලි සම්ප්‍රදායයේ දී සතර අභිනයන් ම යොදා ගන්නා අතර, ආහාර්යා අභිනයට ප්‍රමුඛ ස්ථානයක් ලැබේ. රංග වස්ත්‍රාභරණ හා වේශ නිරූපණය අනෙක් නර්තන සම්ප්‍රදායයන්ට වඩා සංකීර්ණ වේ. භරත සහ කථකලි නර්තනවල දී හස්ත මුද්‍රා භාවිත කරන අතර, ශිල්පීන්ට අක්ෂි චලන අභ්‍යාස කිරීම අනිවාර්ය ය. මෙහි දී සතර අභිනය භාවිතයෙහි ඇති වැදගත්කම පැහැදිලි වේ. කථකලි සම්ප්‍රදායයේ දී තුළ අංග, ප්‍රත්‍යංග, උපාංග භාවිතය පුහුණු කිරීමට ශිල්පීන්ගේ ශරීරයේ තෙල් ආලේප කොට සම්බාහන ක්‍රියාවලියක් සිදු කොට ''කළුවකෙට්ට''

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

නම් අභ්‍යාස පුහුණුවක් ද ලබා දෙයි. මේ ආකාරයෙන් භාරතීය නර්තන සම්ප්‍රදායයන්හි සතර අභිනයන්ට සුවිශේෂ ස්ථානයක් හිමි වන බව වැඩිදුරටත් සඳහන් කළ හැකි ය.

## කාර්ය පත්‍රිකාව

1. නිවැරදි පිළිතුර යා කරන්න.

- නන්දිකේශ්වර - පසුතල නිර්මාණ
- උපාංග භාවිතය - දෙබස් සංවාද
- ප්‍රත්‍යංග - සාත්ත්වික අභිනය
- වාචික අභිනය - අභිනය දර්පණය
- ආහාර්ය අභිනය - ආංගික අභිනය

2. පහත සඳහන් චරිත සතර අභිනය යොදා ගනිමින් පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කරන්න.
   සොකරි, පරයා, ජස ලෙංචිනා සහ
   ඔබ කැමති ශාන්ති කර්මයක නාට්‍යමය අවස්ථාවක්

3. ප්‍රකාශන විධි ක්‍රම අනුගමනය කරමින් දෙබස් හා සංවාද සහිත ව කුඩා කතාවක් නිර්මාණය කරන්න.

4. ශාන්තිකර්මයක නාට්‍යමය අවස්ථාවක් තෝරා ගෙන සතර අභිනයට උදාහරණ දෙමින් විස්තර කරන්න.

5. සාර්ථක නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමට සතර අභිනය උපයෝග කර ගත හැකි ආකාරය පිළිබඳ ව විස්තරයක් කරන්න.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)